11 ශ්‍රේණිය

ඉතිහාසය

2.2 ඒකකය

# ඉංග්‍රීසීන් උඩරට රාජධානිය යටත් කිරීම හා විදේශ ආධිපත්‍යයට එරෙහි සටන්

ක්‍රියාකාරකම් පත්‍රිකාව



## ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පිහිටුවීම

# ක්‍රියාකාරකම්

1. ෆෙඩ්‍රික් නෝත්ගෙන් පසු ලංකාවට පත්ව ආණ්ඩුකාරවරයා කවුද ?
2. තෝමස් මේට්ලන්ඩ් ආණ්ඩුකාරවරයා ලංකාවට ගෙන්වා ගනු ලැබූ කාර්ය කාර්යශූරය සිවිල් නිලධාරියා කවුද ?
3. ජෝන් ඩොයිලි සිංහල භාෂාව හදාරනු ලැබුවේ කිනම් හිමිනමක් යටතේ ද ?
4. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ගැටුම් ඇති කර ගනු ලැබූ උඩරට රාජධානියේ අවසාන මහා අදිකාරම්වරු දෙදෙනා කවුද ?
5. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු හා මහජනතාව අතර තිබූ සබඳතාව බිඳ වැටීමට හේතු මොනවාද ?
6. ඉංග්‍රීසීන් උඩරට ආක්‍රමණය කරන විට ශ්‍රී වික්‍රම රාජසිංහ රජු මහනුවර නගරය අතහැර සැඟවුණු මැද මහනුවර පිහිටි ආරක්ෂිත ස්ථානය කුමක්ද ?
7. 1815 මාර්තු දෙවන දින අත්සන් කළ ගිවිසුමට අත්සන් තැබූ පාර්ශව දෙකට අයත් පුද්ගලයන් කවුද ?
8. ගිවිසුම අත්සන් කිරීමට පෙර ඉංග්‍රීසි කොඩිය එසවීම නිසා එය නැවත පහත හෙලා සිංහල කොඩිය යළි එසවීමට ක්‍රියා කළ හිමිනම කවුද ?
9. උඩරට අත්පත් කරගැනීමෙන් පසු උඩරට පාලනය සඳහා ආණ්ඩුකාරවරයාගේ නියෝජිතයා වශයෙන් නේවාසික නිලධාරියෙකු ලෙස පත් කරන ලද්දේ කවුද ?
10. 1818 නිදහස් සටනට තුඩු දුන් හේතු දෙකක් විස්තර කරන්න.
11. 1818 සටනේ ස්වභාවය කෙටියෙන් පහදන්න.
12. ප්‍රධාන පෙළේ රදළයන් අතරින් 1818 සටනට එකතු නොවූ රදළවරුන් කවුද ?
13. *මෙම පින්තූරයෙන් දැක්වෙන්නේ කවුද?
    *ඔහු කුමන සටනක් සඳහා සම්බන්ධද?
    *එම සටනට සම්බන්ධ වීමෙන් ඔහුට අත් වූ ඉරණම කුමක්ද?



14. 1848 නිදහස් අරගලයට බලපෑ හේතූන් අතරින් ආසන්නතම හේතුව හා කෝල්බෲක් ප්‍රතිසංස්කරණයේ බලපෑම් දෙකක් කෙටියෙන් විස්තර කරන්න.
15. 1848 සටනේ ස්වභාවය කෙටියෙන් පහදන්න.